

# අයවැය ලේඛනය

# வரவுசெலவு

# BUDGET

# 2024

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව

මොරහැල,බලංගොඩ

**இம்புல்பே பிரதேச சபை**

**மொரஹெல,பலாங்கொடை**

**Imbulpe Pradeshiya Sabha**

**Morahela, Balangoda**

# පටුන


| අනු අංකය | විස්තරය | පිටු අංකය |
|---|---|---|
| 1 | දැක්ම හා මෙහෙවර | i |
| 3 | ලේකම්තුමියේ පණිවිඩය | ii |
| 4 | බල ප්‍රදේශයේ සිතියම | iii |
| 5 | ඉඹුල්පේ ප්‍රාදේශිය සභාවේ පිහිටීම හා පසුබිම | iv |
| 6 | ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ පොදු තොරතුරු | v - vii |
| 7 | අනුමත කාර්ය මණ්ඩල විස්තර | viii |
| 8 | කාර්ය මණ්ඩල නාම ලේඛණය | ix - x |
| 9 | සංවිධාන සැලස්ම | xi |
| 10 | 2024 අයවැය ලේඛණය අනුමත නිවේදනය | xii |
| 11 | 2024 වර්ෂයේ පුනරාවර්තන අය සාරාංශය | 01 |
| 12 | 2024 වර්ෂයේ පුනරාවර්තන වැය සාරාංශය | 02 |
| 13 | 2024 වර්ෂයේ පුනරාවර්තන , ප්‍රාග්ධන ලැබීම් හා වැය සාරාංශය | 03 |
| 14 | පොදු පරිපාලනය ආදායම් ඇස්තමේන්තුව | 04 - 05 |
| 15 | සෞඛ්‍ය සේවා ආදායම් ඇස්තමේන්තුව | 06 - 07 |
| 16 | භෞතික සැලසුම් මංමාවත්,ඉඩම් හා ගොඩනැගිලි ආදායම් ඇස්තමේන්තුව | 08 - 09 |
| 17 | ජල සේවා ආදායම් ඇස්තමේන්තුව | 10 - 11 |
| 18 | මහජන උපයෝගිතා ආදායම් ඇස්තමේන්තුව | 12 - 13 |
| 19 | සුභසාධක සේවා ආදායම් ඇස්තමේන්තුව | 14 - 15 |
| 20 | පොදු පරිපාලනය වියදම් ඇස්තමේන්තුව | 16 - 17 |
| 21 | සෞඛ්‍ය සේවා වියදම් ඇස්තමේන්තුව | 18 - 19 |
| 22 | භෞතික සැලසුම් මංමාවත්,ඉඩම් හා ගොඩනැගිලි වියදම් ඇස්තමේන්තුව | 20 - 21 |
| 23 | ජල සේවා වියදම් ඇස්තමේන්තුව | 22 - 23 |
| 24 | මහජන උපයෝගිතා වියදම් ඇස්තමේන්තුව | 24 - 25 |
| 25 | සුභසාධක සේවා වියදම් ඇස්තමේන්තුව | 26 - 27 |
| 26 | සභාව සතු වත්කම් හා ආදායම් වියදම් දත්ත සාරාංශය | 28 - 30 |

# දැක්ම

**"ඉසුරින් පිරි සුපසන් පුරවරයක්"**

# මෙහෙවර

**"පැවරී ඇති බලතල කාර්ය හා කර්තව්‍යයන්**

**ඵලදායී ලෙස යොදාගනිමින් ජනතාවගේ**

**ජීවන තත්වය  සුඛිත මුදිතකිරීම**

**අපගේ මෙහෙවර  වන්නේය".**



# ලේකම් තුමියගේ පණිවුඩය.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව ප්‍රාදේශීය ජනතාවගේ පොදු අවශ්‍යතා ඉටුකර " ඉසුරින් පිරි සුපසන් පුරවරයක් "යන දැක්ම යථාර්තයක් කර ගැනීමේ අරමුණ පෙරදැරිව 2024 වර්ෂයට අදාල අය වැය ලේඛනය සකස් කිරීමට කටයුතු කරන ලදී. ප්‍රදේශයේ ජනතාවගේ අධ්‍යාපන, සෞඛ්‍ය, සනීපාරක්ෂාව, මහජන උපයෝගීතාව හා සමාජ සුබ සාධනය ඉහළ නැංවීම කෙරෙහි මෙවර අයවැය මගින් අවධානය යොමුකර ඇත.

මෙවර අයවැය මගින් ස්වයංඋත්පාදන ආදායම් ලෙස රු මිලියන 20.8 ක පමණ ආදායමක් උත්පාදනයකර ගැනීමට අපේක්ෂා කරන අතර 2024 වර්ෂයේ අයවැය සාරාංශය මෙසේ වේ.

| | | |
|---|---|---|
| පුනරාවර්තන හා ප්‍රාග්ධන ආදායම | - | රු.122,422,461.42 |
| පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම | - | රු.122,420,898.64 |
| අතිරික්තය | - | රු. 1,562.78 |

පසුගිය කාලය රට තුල පැවති ආර්ථික හා දේශපාලන අර්බුධයන් හමුවේ සභාවට ලැබිය යුතු ආදායම් පහත වැටුණි. අප සභාවේ ප්‍රධාන ආදායම් මාර්ගය ජල සැපයුම් සේවාව වේ. 2024 වර්ෂයේ ජල සේවා ගාස්තු වැඩිකිරිමටත් හිඟ අය කර ගැනීමට සැලසුම් කර ජල සේවා ආදායම් වැඩි කර ගැනීමට ද, 2023 වරිපනම් බදු ප්‍රතිශෝධනය 2024 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට ද අපේක්ෂා කරමි. මෙවර අයවැය සැකසීමේදී පෙර වර්ෂවල ආදායම් වියදම් පිළිබඳව පුරෝකතනයක් කරමින් නිවැරදි හා යථාර්තවාදී අයවැයක් ඉදිරිපත් කිරීමට උත්සහ කරන ලද අතර එය සාර්ථක වීම පිළිබඳව සතුටට පත්වෙමි.

අප සභාවේ මුළු ආදායමෙන් 94% ස්වයං උත්පාදන ආදායම් වේ.ආදායම් උත්පාදන මාර්ගයන්හි වර්ධනයක් තුළින් ජනතාවට වඩාත් ගුණාත්මක සේවාවන් සැපයිම, යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීම තුළින් ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති කිරීම කෙරෙහි අපගේ විශේෂ අවධානය යොමුකර ඇත. පවත්නා මානව හා භෞතික සම්පත් නිසිලෙස කලමනාකරණය කර ජනතාවගේ සුබ විහරණය හා ජීවන තත්ත්වය ඉහලනැංවීම උදෙසා වැඩසටහන් සංවිධානය කිරීමට හා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරමි.

ග්‍රාම නිලධාරී වසම් පනහක ගම් දෙසිය පනස් හයක් පුරා විසිරී සිටින හැටහත් දහසකට අධික ජනතාවකගේ මානව හා සමාජීය අවශ්‍යතා සුබ සාධනය හා සුබ විහරණය සැලසීමට අදාළ කාර්යයන් සිදු කිරීමේ දී අවශ්‍ය වන පරිපාලනමය උපදෙස් හා දැනුවත් කිරීම් සිදු කළ පළාත් පාලන කොමසාරිස් තුමා, සහකාර පළාත් පාලන කොමසාරිස් තුමා ඇතුළු පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත මාගේ ස්තුතිය පුද කරමි. එසේම ඉදිරියට ද එවැනි මහ පෙන්වීම් අපේක්ෂා කරමි.

2024 අයවැය සැකසීමේදී අයවැය යෝජනා ඉදිරිපත් කළ සියළු දෙනාට, සාර්ථක හා නිවැරදි අයවැය ලේඛණයක් සකස් කිරීමට කටයුතුකල විෂය නිලධාරීනියට මාගේ ගෞරවණීය ස්තුතිය පුදකරමි. ඵලදායි අයවැයක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය තොරතුරු ලබාදෙමින් සහයෝගය දැක් වූ සමස්ථ කාර්ය මණ්ඩලයටද මෙම වර්ෂයේ ත්‍රෛභාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවමින් දමිළ මාධ්‍යයට පරිවර්තනයකර දුන් වී. ධර්මලිංගම් මහතාට හා ඉංග්‍රීසි මාධ්‍යයට පරිවර්තනයකර දුන් බී.එල්.සී.කෞෂල්‍යා මියටද මාගේ ස්තුතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

උදාවන්නා වූ 2024 වර්ෂය ඔබ සැමට සතුට, සෞභාග්‍ය සපිරි යහපත් බලාපොරොත්තු ඉටුවන සුභ නව වසරක් වේවා!

ඩී. ජේ.සී රෝහිණී දසනායක
ලේකම්,
ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව,

# GN DIVISION & ROAD NETWORK
# IMBULPE PRADESHIYA SABHA

| POINT | NAME |
|---|---|
| AGA | Divisional Secretariat |
| ASC | Agrarian Services Centre |
| BH | Base Hospital |
| BT | Buddhist Temple |
| CH | Church |
| CO-OP | Co-operative Shop |
| D | Dispensary |
| FC | Factory |
| H | Hospital |
| HC | Health Centre |
| HO | Hotel |
| HT | Hindu Temple |
| M | Mosque |
| MOH | Medical Officer of Health Office |
| RB | Rural Bank |
| RH | Rest House |
| S | School |
| SPO | Sub Post Office |
| U | Sabaragamuwa University |
| VO | Veternary Office |
| ZEO | Zonal Education Office |




| GND CODE | GND NAME |
|---|---|
| 279B | Yakdehiwela |
| 278A | Viharawela |
| 279A | Kumburutheniwela |
| 276A | Puwakgahawela |
| 267 | Bolthumbe |
| 278 | Ihalagalagama |
| 276 | Muttettuwegama |
| 268A | Pinnawala |
| 266B | Rawanakanda |
| 268 | Udagama |
| 277 | Halpe |
| 269B | Pidaliganniawela |
| 269 | Maddegama |
| 279 | Belihuloya |
| 266C | Gallenakanda |
| 277B | Nittamaluwa |
| 266D | Kattadikanda |
| 267B | Bellankanda |
| 267A | Gurubewila |
| 277A | Budunwela |
| 266A | Waleboda North |
| 272A | Passaramulla |
| 271 | Alakoladila |
| 274 | Silogama |
| 269A | Kanathiriyanwela |
| 276B | Karagasthalawa |
| 272 | Imbulpe |
| 271A | Atawakwela |
| 267C | Pallewela |
| 267D | Pandeniya |
| 272C | Medagedaragoda |
| 272B | Amuwethugoda |
| 264C | Pagalovita |
| 275 | Kinchigune |
| 275A | Kumbalgama |
| 264B | Maddethalawa |
| 273C | Amupitiya |
| 273 | Aluthnuwara |
| 264 | Morahela |
| 264A | Wagapitiya |
| 273A | Thotapalla |
| 263A | Naluwela |
| 262C | Ulupitiya |
| 262B | Thunkinda |
| 263B | Welanhinna |
| 264D | Olugenthota |
| 273B | Mamalgaha |
| 263 | Rathmalavinna |
| 262 | Hatharabage |
| 262A | Karadiyamulla |

# ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටීම හා පසුබිම.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාබල ප්‍රදේශය ඓතිහාසික හා පුරා විද්‍යාත්මක තොරතුරු අනුව ක්‍රි.පූ.දෙවන සියවස දක්වා විහිදුන ඓතිහාසික පසුබිමක් ඇති අතර රාවණා යුගය දක්වා තොරතුරු ජනශ්‍රැති ඇසුරින් හඳුනා ගත හැක.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ උතුරු සීමාවට අයත්ය. එය උතුරු දෙසින් නුවරඑලිය දිස්ත්‍රික් මායිමෙන් ද දකුණින් හා බටහිරින් බලංගොඩ නගර සභා සීමාවෙන්ද නැගෙනහිරින් බදුල්ල දිස්ත්‍රික්කයේ හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභා සීමාවෙන්ද සීමා වී ඉඹුල්පේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අනුරූප ලෙස පිහිටා ඇත.

මෙහි මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර 25,600 ක් පමණ වේ. ගම් 256 ක් අතර ග්‍රාම නිළධාරී වසම් 50 කි. වැඩිපුර ග්‍රාමීය ජනතාවක් වෙසෙන අතර ගලගම, පින්නවල, පඹහින්න හා රත්මලවින්න ග්‍රාමීය නගර ලෙස හැදින්විය හැක.

භූ විෂමතාවය තුල ඉතා වැදගත් පිහිටීම් රැසක් දැකිය හැකි මෙම ප්‍රදේශයේ ඊසාන දිග කොටසේ මායිම තුල කුඩා ලෝකාන්තය හා මහලෝකාන්තය පිහිටා ඇත.ඊට අමතරව ප්‍රදේශයේ ඉහලම ස්ථානය වන අඩි 6747 ක් උසැති ගොම්මමෙහෙල කන්ද ඇතුලුව බලතුඩුව කන්ද.හාවාගල ,බිබිලෙ කන්ද,පරවියන්ගල කන්ද, තෝරවේල කන්ද,හා රාවනා කන්ද යන ප්‍රධාන කඳු වැටි මෙම බල ප්‍රදේශයේ පිහිටා ඇත.

මෙම ප්‍රදේශය තුල භූ විදයාත්මක වශයෙන් සම්පූර්ණයෙන් ප්‍රාග් ක්‍රේම්බීය යුගයට අයත් උස් බිම් ශ්‍රේණියට අයත් පාෂාණ වලින් සමන්විත වන ක්වාට් සයිට්,ග්‍රැනයිට් නයිස්,ජනොකයිට්,මාබල් ආදී දැකිය හැකිය.

ජලවහනය හා එහි රටාවන් සැලකීමේදී වලවේ ගඟ මෙම කොට්ඨාශයේ දකුණු දිශානුගතව ගලා බසී.ඊට අමතරව වර්ෂය පුරා පිරීගිය ජල ධාරාවෙන් පෝෂිත වූ දෙනගම් ඔය,හිරිකටුඔය හා බෙලිහුල්ඔය මෙම ප්‍රදේශයෙන් ගලා බසී.වලවේ ගඟ හා බෙලිහුල්ඔය හරස් කර සමනල වැව ඉදිකර ඇත. මෙම කොට්ඨාශය තුල දේශගුණික තත්වය පදනම් කරගෙන උෂ්ණත්වය වෙනස්වීම් දැකිය හැකි අතර සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 20ක් පමණවේ.

මානව සිත් ඇදබැඳ ගන්නා සොබා සෞන්දර්යකින් සමන්විත වූ ඉඹුල්පේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය විවිධ ජන වර්ග වලින් යුක්තව විවිධ ආගම් වලට අයත් මානව දයාවෙන් පිරුණු ජන ගහණයකින් සමන්විත අතර විවිධ වූ සංස්කෘතික ආභාෂයන්ගේ සංකලනයක් දවේ.

දිනෙන් දින සංවර්ධනය කරා දිවෙන ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඉදිරි දශකය තුල බෙලිහුල්ඔය කේන්ද්‍රගතව සංචාරක කර්මාන්තය තුළින් නව සංවර්ධන දිශානතියකට ඇදෙනු ඇතැයි අපේක්ෂා කලහැක.

# ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාල පොදු තොරතුරු

| | |
|---|---|
| 01.පළාත | සබරගමුව |
| 02.දිස්ත්‍රික්කය | රත්නපුර |
| 03.ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ඉඹුල්පේ |
| 04.මැතිවරණ කොට්ඨාශය | බලන්ගොඩ |
| 05.බල ප්‍රදේශයේ විශාලත්වය | 256 $km^2$ |
| 06.පුද්ගලික ඉඩම් | 10,871 |
| 07.රජයේ ඉඩම් | 12,266 |
| 08.ග්‍රාමනිලධාරී වසම් | 50 |
| 09.ගම් | 256 |
| 10.ප්‍රා .සභා මන්ත්‍රී කොට්ඨාශ ගණන | 13 |
| 11.මුළු ජන්දදායක සංඛ්‍යාව | 50,316 |
| • ස්ත්‍රී | 25,603 |
| • පුරුෂ | 24,713 |
| 12.ජනගහන තොරතුරු | |
| • මුළු ජනගහනය | 67,868 |
| පුරුෂ | 33,399 |
| ස්ත්‍රී | 34,469 |
| • මුළු පවුල් ගණන | 19,698 |
| • සමෘද්ධි ආධාර ලබන පවුල් සංඛ්‍යාව | 7,594 |
| • මහජන ආධාර ලබන පවුල් සංඛ්‍යාව | 1,774 |
| • කාන්තා මූලික පවුල් | 1,965 |
| • ආබාධිතයන් සිටින පවුල් | 529 |
| 13.වරිපනම් ගෙවන දේපල සංඛ්‍යාව | 641 |
| 14.අක්කර බදු ගෙවන දේපල සංඛ්‍යාව | 168 |
| 15. වෙළඳ බලපත්‍ර ලබා ගන්නා ස්ථාන | 269 |
| 16. ජල පාරිභෝගික සංඛ්‍යාව | 2,519 |
| • නලුවෙල | 51 |
| • ගලගම | 326 |
| • පඹහින්න | 442 |
| • අලුත්නුවර | 711 |
| • වැටකොලුලන්ද | 68 |
| • වෙලන්හින්න | 32 |
| • අමුවතුගොඩ | 18 |
| • රත්මලවින්න | 280 |
| • පින්නවල | 516 |
| • නාකැටියවත්ත | 75 |
| 17.ආගමික ස්ථාන | |
| • පන්සල් හා ආරාම | 60 |
| • කතෝලික පල්ලි | 07 |
| • හින්දු කෝවිල් | 27 |
| 18.ව්‍යාපාරික ස්ථාන | |
| • සමූපකාර වෙළඳසැල් | 02 |
| • සිල්ලර වෙළඳසැල් | 365 |
| • වී මෝල | 34 |
| • පිටි/මිරිස් මෝල් | 06 |
| • පොල්තෙල් මෝල් | 04 |
| • බේකරි | 10 |
| • ආපනශාලා හා තේ පැන් හල් | 95 |
| • මස් මාළු එළවළු සැල් | 58 |
| • බෙහෙත් ශාලා /ෆාමසි | 10 |
| • ලී/යකඩ ගෘහ භාණ්ඩ අලෙවි සැල් | 10 |
| • වඩුමඩු/ලී මෝල් | 05 |
| • කළුගල් වළවල් | 03 |

- මෝටර් රථ අමතර කොටස් අලෙවි සැල් 34
- සැලුන් හා රූපලාවන්‍යාගාර 40
- සපත්තු හා රෙදිපිළි අලෙවි සැල් 50
- ගොඩනැගිලි අලෙවි සැල් 29
- පොත්පත් හා ලිපි ද්‍රව්‍ය 31
- විදුලි උපකරණ 11
- සාප්පු බඩු 18
- මත්පැන් අලෙවි හල් 03

19.ප්‍රදේශීය සමිති හා සංගම්

- යෞවන සමාජ 56
- ග්‍රාම සංවර්ධන සමිති 25
- සමුපකාර ණයදෙන සමිති 19
- කාන්තා සමිති 21
- සුභ සාධක සමිති 37
- අවමගල්‍යාධාර සමිති 66

20.රාජ්‍ය හා පෞද්ගලික ආයතන

- සුසාන භූමි 48
- රජයේ පාසල් 41
- පිරිවෙන් 02
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 04
- ළදරු පාසල් 47
- බෞද්ධ දහම් පාසල් 49
- කතෝලික දහම් පාසල් 05
- රජයේ රෝහල් 03
- මධ්‍යම බෙහෙත් ශාලා 03
- පෞද්ගලික බෙහෙත් ශාලා 05
- ආයුර්වේද බෙහෙත් ශාලා 06
- මාතෘ නිවාස 05
- පුස්තකාල 02
- කසළ කළමනාකරණ මධ්‍යස්ථාන 02
- සති පොළ 02

21.කර්මාන්ත ආයතන

- ආහාර බීම වර්ග හා දුම්කොළ ආශ්‍රිත 12
- රෙදිපිලි ඇඳුම් පැලඳුම් හා සම් භාණ්ඩ ආශ්‍රිත 10
- දැව හා ගෘහ භාණ්ඩ නිෂ්පාදන ආශ්‍රිත 05
- රසායන ද්‍රව්‍ය ,ඛනිජ තෙල් රබර් හා ප්ලාස්ටික් ආශ්‍රිත 08
- ලෝහ කර්මාන්ත ආශ්‍රිත 04

22.නිවාස පිළිබඳ තොරතුරු

- ස්ථිර නිවාස 16,952
- අර්ධ ස්ථිර නිවාස 1,491
- තාවකාලික නිවාස 209
- නිවාස නොමැති 398

## දර්ශනීය ස්ථාන

1.බෙලිහුල්ඔය
2.සමනලවැව
3.ගලගම ඇල්ල
4. පහන්තුඩාවල
5.කොහිලවල
6. ලෝකාන්තය පහළ කොටස
7.සුරතලි ඇල්ල
8. දෙගල් ඇල්ල
9. හාවාගල
10.ගැරඩි ඇල්ල
11.රන්මුදු ඇල්ල
12.බෙලිහුල්ඔය දියපහස ගිමන්හල
13.දෙමළි ඇල්ල
14.අලිය වැටුණ වළ
13.වළවල් තුන



පහන්තුඩාව,බෙලිහුල්ඔය

## වැදගත් ආගමික ස්ථාන



අලුත් නුවර කතරගම දේවාලය

- අළුත්නුවර කතරගම දේවාලය
- බොල්තුඹේ සමන් දේවාලය
- ඵළුගාල ශ්‍රී පුෂ්පාරාමය
- මැද්දේගම විහාරය
- ගලගම ගල්ලෙන විහාරය
- කණතිරියන්වල රෝමානු කතෝලික පල්ලිය
- කණතිරියන්වල විහාරස්ථානය
- කරගස්තලාව විහාරස්ථානය
- කුඹල්මුල්ල ශ්‍රී පත්තිනි දේවාලය
- මොරහැල ශ්‍රී පත්තිනි දේවාලය

## මහා මාර්ග පිළිබඳ විස්තර

| | |
|---|---|
| 1.ඇල්ලේඅරාව - මරංගහවෙල | ජ් |
| 2. ඇල්ලේඅරාව - මාරතැන්න | සී |
| 3. ඇල්ලේඅරාව - වලේබොඩ | සී |
| 4. බෙලිහුල්ඔය - ඉහලගලගම | සී |
| 5.බෙලිහුල්ඔය - නන්පේරියල් | සී |
| 6.රත්මලවින්න - හතරබාගේ | සී |
| 7.මාමල්ගහ - උලුපිටිය | සී |
| 8.ඕලුගංතොට - කරදියමුල්ල | සී |
| 9.කණතිරියන්වල - හෙලපන්දෙනිය | සී |
| 10.කෙසෙල්කොටුව - නෙල්ලිවල | සී |
| 11.අමුවතුගොඩ - නෙල්ලිවල | සී |
| 13.මොරහැල - අමුපිටිය | සී |
| 14.පඹහින්න - කිංචිගුණ් | සී |
| 15.පින්නවල - මද්දෙගම | සී |



බේකස් බෙන්ඩ්, නන්පේරියල්

## ප්‍රාදේශිය සභා මාර්ග

| | | |
|---|---|---|
| තාරදමා ඇති මාර්ග | 60 | (කි.මී 38) |
| කොන්ක්‍රීට් මාර්ග | 87 | (කි.මී 91) |
| බොරලු මාර්ග | 168 | (කි.මී 290) |
| අඩි පාර | 09 | (කි.මී 09) |

## ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ අනුමත කාර්ය මණ්ඩලය

| අනු අංකය | තනතුරු නාමය | අනුමත සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | තාවකාලික සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1. | ලේකම් කළමනාකරණ සහකාර අධි ශ්‍රේණිය | 1 | _ | 1 | _ |
| 2. | ආයුර්වෙද වෛද්‍ය නිළධාරි | 1 | - | 1 | - |
| 3. | සංවර්ධන නිලධාරී | 19 | 24 | - | - |
| 4. | පුස්තකාලයාධිපති | 2 | 1 | 1 | _ |
| 5. | තාක්ෂණ සේවා නිලධාරී | 2 | 1 | 1 | _ |
| 6. | සහකාර තාක්ෂණ සේවා නිලධාරී | 1 | - | 1 | - |
| 7. | කළමනාකරන සේවා නිලධාරී | 8 | 8 | - | - |
| 8. | ආදායම් පරික්ෂක නිලධාරී | 2 | 1 | 1 | _ |
| 9. | කාර්යාල කාර්ය සහයක | 4 | 3 | 1 | - |
| 10. | ඖෂධ සංයෝජක | 2 | 1 | 1 | - |
| 11. | පුස්තකාල සහයක | 4 | 3 | 2 | - |
| 12. | විදුලි කාර්මික | 3 | 2 | 1 | - |
| 13. | රියදුරු | 7 | 6 | 1 | 1 |
| 14. | බර යන්ත්‍ර ක්‍රියාකරු | 1 | 1 | - | - |
| 15. | වැඩ ක්ෂේත්‍ර කම්කරු | 11 | 11 | - | 3 |
| 16. | මුරකරු | 3 | 2 | 1 | - |
| 17. | සනීපාරක්ෂක කම්කරු | 8 | 7 | 2 | 4 |
| | එකතුව | 79 | 71 | 15 | 8 |

# ඉඹුල්පේ ප්‍රාදේශිය සභාවේ කාර්ය මණ්ඩල නාම ලේඛනය

| | |
|---|---|
| 01. ඩී.ජ්.සී.ආර්.දසනායක මිය | ලේකම් |
| 02. එම්.එන්.පී.මුණසිංහ මයා | තාක්ෂණ සේවා නිළධාරි |
| 03. එම්. ලක්ෂිත තරිදු කුමාර මුදියන්සේ මයා | ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී |
| 04. ඩබ්.කේ.රත්නසිලි මිය | පුස්තකාලයාධිපති |
| 05. යු.එම්.ජයතිලක මයා | සංවර්ධන නිළධාරි |
| 06. ඩී.එම්.එම්.පී. දෙල්ගහතැන්න මයා | සංවර්ධන නිළධාරි |
| 07. ජේ.එච්.ඒ.මදූෂානි ගුණදාස මිය | සංවර්ධන නිළධාරි |
| 08. ටී. ටී. රුවන්දිකා මිය | සංවර්ධන නිළධාරි |
| 09. ටී.එම්.ජේ.ලක්ෂිකා තෙන්නකෝන් මිය | සංවර්ධන නිළධාරි |
| 10. පී.දීපිකා සංජීවනී විජේසිරි මිය | සංවර්ධන නිළධාරි |
| 11. ඊ.කේ.එල් ශිරෝමනි කුමාරි මිය | සංවර්ධන නිළධාරි |
| 12. ටී.ඩී.එල්.එන්. ජයතිලක මිය | සංවර්ධන නිළධාරි |
| 13. එන්.ඒ.එස්. පුෂ්පලතා මිය | සංවර්ධන නිළධාරි |
| 14. යු.කේ.ඩී.බී.එස්. උඩවත්ත මෙය | සංවර්ධන නිළධාරි |
| 15. පී.එම්. විජයන්ති රත්නකාන්ති මිය | සංවර්ධන නිළධාරි |
| 16. ආර්. කේ. එස්. ජීවන්ති මිය | සංවර්ධන නිළධාරි |
| 17. ඒ.එම්.චතුරංග බණ්ඩාර අත්තනායක මයා | සංවර්ධන නිළධාරි |
| 18. ජේ.ඩී.තක්ෂිලා ආරියදාස මෙය | සංවර්ධන නිළධාරි |
| 19. ජී.නිමාලි ෆොන්සේකා මිය | සංවර්ධන නිළධාරි |
| 20. ටී.ජී.කේ.පී.විජේපාල මිය | සංවර්ධන නිළධාරි |
| 21. එම්.ඒ.එල් කුමුදු කුමාරි මිය | සංවර්ධන නිළධාරි |
| 22. ඒ.එස්.ටී.ඩී අමුවල මයා | සංවර්ධන නිළධාරි |
| 23. ජී.වී අනුෂා ආනන්ද කුමාරි මිය | සංවර්ධන නිළධාරි |
| 24. එස්.ඒ දේවිකා උදේනි ජයසේකර මිය | සංවර්ධන නිළධාරි |
| 25. සංජීවනී ගමගේ මිය | සංවර්ධන නිළධාරි |
| 26. පී.එම් චාමර අනුරුද්ධ බණ්ඩාර මයා | සංවර්ධන නිළධාරි |
| 27. කේ.පි.ජී.සඳුන් උදය කුමාර මයා | සංවර්ධන නිළධාරි |
| 28. එම්.ජී.ශකිලා දිනිති තිලකරත්න මිය | සංවර්ධන නිළධාරි |
| 29. කේ.එම් ආශා දීපානී මිය | කළමනාකරණ සේවා නිලධාරී |
| 30. කේ.කේ.චමෝදි ප්‍රසන්තිකා මිය | කළමනාකරණ සේවා නිලධාරී |
| 31. එල්.කේ.ටී.කුමුදුමාලි ආරියදාස මිය | කළමනාකරණ සේවා නිලධාරී |
| 32. එස්.ඒ.දීපිකා උදේශිනී සුහසිංහ මෙය | කළමනාකරණ සේවා නිලධාරී |
| 33. ඒ.එම්.එෆ් සෆ්රා මිය | කළමනාකරණ සේවා නිලධාරී |
| 34. ඒ.ආර්.එස්.එස් අත්තනායක මිය | කළමනාකරණ සේවා නිලධාරී |
| 35. ඩබ්.රුවින්ද ප්‍රසාද් විජේසිංහ මයා | ආදායම් පරිපාලක |
| 36. එච්.එම්. අසේල බුද්ධික මයා | පුස්තකාල සහායක |
| 37. ඊ.එම්.සී.ඇල්ලෙපොල මිය | පුස්තකාල සහායක |
| 38. ඩී.ආර්. ධනුෂ්ක රාජපක්ෂ මයා | කාර්යාල කාර්ය සහායක |
| 39. ඩබ්.ඒ.පී.චතුරංග චන්ද්‍රසේන මයා | කාර්යාල කාර්ය සහායක |
| 40. ආර්.එම්.පී.කාන්ති මිය | කාර්යාල කාර්ය සහායක |
| 41. එම්.සී.මල්කාන්ති මිය | ඖෂධ සංයෝජක |
| 42. එන්. දිල්හානි සමන්මලි මිය | ආයුර්වේද කම්කරු |
| 43. ඊ.එම්.වික්‍රමරත්න මයා | වැඩක්ෂේත්‍ර කම්කරු |
| 44. එම්.ජී. පියල් රාමචන්ද්‍ර මයා | වැඩක්ෂේත්‍ර කම්කරු |
| 45. ඩබ්.ඩී.ජයතිස්ස මයා | වැඩක්ෂේත්‍ර කම්කරු |
| 46. ඩබ්. පී. විජේරත්න මයා | වැඩක්ෂේත්‍ර කම්කරු |
| 47. එන්.ඩබ්.එස්. ප්‍රියන්ත ජයවර්ධන මයා | වැඩක්ෂේත්‍ර කම්කරු |
| 48. බී.එම්.බුද්ධදාස මයා | වැඩක්ෂේත්‍ර කම්කරු |
| 49. ඩබ්.පී. කුමාරසිංහ මයා | වැඩක්ෂේත්‍ර කම්කරු |
| 50. ඒ.එම්. ප්‍රේමරත්න මයා | වැඩක්ෂේත්‍ර කම්කරු |
| 51. ඩබ්.ඩී.ජේ.කුමාරතිස්ස මයා | වැඩක්ෂේත්‍ර කම්කරු |

| | |
|---|---|
| 52. ජේ.ආර්.සී.ඩී.අබේරත්න මයා | වැඩක්ෂේත්‍ර කම්කරු |
| 53. ජී.ආර්.නුවන් අනුරුද්ධ මයා | වැඩක්ෂේත්‍ර කම්කරු |
| 54. බී.ඩී. තිලක් පුෂ්පකුමාර මයා | විදුලි කාර්මික |
| 55. සී.ආර්.සී.පුෂ්පකුමාර මයා | විදුලි කාර්මික |
| 56. ඩබ්.පී. රංජිත් ලාල් මයා | මුරකරු |
| 57. එච්.ඩබ්.රන්දික චාමර මයා | මුරකරු |
| 58. පී.එම් අනුරුද්ධ පුෂ්පකුමාර මයා | රියදුරු |
| 59. මහින්ද ජයවර්ධන මයා | රියදුරු |
| 60. ඩබ්.සී.රොෂාන් වැලිකල මයා | රියදුරු |
| 61. කේ.නිශාන්ත මයා | රියදුරු |
| 62. යු.එම්.ගයාන් මධුශංක මයා | රියදුරු |
| 63. කේ.ජී.අමල් කෝසල මයා | රියදුරු |
| 64. එස්.සුදර්ශන් මයා | රියදුරු |
| 65. කේ.වී.අනුරුද්ධ කරුණාරත්න මයා | බර යන්ත්‍ර ක්‍රියාකරු |
| 66. යු.ජී ඉන්දික පුෂ්ප කුමාර මයා | සෞඛ්‍ය කම්කරු |
| 67. කේ. එච්. විජේසිරි මයා | සෞඛ්‍ය කම්කරු |
| 68. ආර්. කේ. අභිනන්ද මයා | සෞඛ්‍ය කම්කරු |
| 69. ඒ. අයුප්කාන් මයා | සෞඛ්‍ය කම්කරු |
| 70. ඩබ්. පී. ප්‍රියරත්න මයා | සෞඛ්‍ය කම්කරු |
| 71. ඊ.එම්.මධුර ජයසිංහ මයා | ආදේශක වැඩක්ෂේත්‍ර කම්කරු |
| 72. ඒ.බී.නිලන්ත දුල්මිණි මයා | සෞඛ්‍ය කම්කරු (කොන්ත්‍රාත්) |
| 73. එල්.ආර්.කේ.චන්දන මයා | සෞඛ්‍ය කම්කරු(කොන්ත්‍රාත්) |
| 74. ජේ.එච්. ප්‍රසන්න කුමාර මයා | සෞඛ්‍ය කම්කරු(කොන්ත්‍රාත්) |
| 75. එම්.එම්.එන්.පී.ජයසිංහ මයා | සෞඛ්‍ය කම්කරු(කොන්ත්‍රාත්) |
| 76. ඒ.ජී.චාමර රුවන් මයා | වැඩ ක්ෂේත්‍ර කම්කරු(කොන්ත්‍රාත්) |
| 77. එස්.ඒ.ඉන්දික පුෂ්පකුමාර මයා | වැඩ ක්ෂේත්‍ර කම්කරු(කොන්ත්‍රාත්) |



Council
Chairman
Secretary
Building Planning Committee
Environmental and Health Committee
Housing and community Development committee
Finance and policy Planning committee
Tender and industrial committee
Technical Assessments Committee
Chief Management Service Officer
Ayurveda Medical Officer
Revenue Supervisor
Management Service Officer
Development Officer
Librarian
Technical officer
Ayurveda Pharmacist
Ayurveda Laborer
Office Assistant
Driver
Heavy Equipment Operator
Watcher
Library Assistant
Field Work Laborer
Health Laborer

# **2024 අයවැය ලේඛනය**
# **ඉඹුල්පේ ප්‍රාදේශිය**
# **සභාව**

**පිටු අංක 01 - 30 දක්වා වූ 2024 වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ඇස්තමේන්තුව ඉඹුල්පේ සභාවේ ප්‍රතිපත්ති හා තීරණ ගැනීමේ කමිටුව විසින් 2023/11/02 වන දින තීරණ අංක 16 යටතේ අනුමත කරන ලදී.**

## ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව
## 2024 වර්ෂයේ පුනරාවර්තන අය සාරාංශය

| ගිණුම් සංකේතය | අය විෂය විස්තරය | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැළසුම් මංමාවත් හා ගොඩනැගිලි | ජල සේවා | මහජන උපයෝගීතා සේවා | සුභසාධක සේවා | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|---|
| **10** | වරිපනම් හා බදු | 987,468.84 | 680,000.00 | - | - | 1,000.00 | 30,000.00 | **1,698,468.84** | **1.47** |
| **20** | කුලී | - | - | 3,550,000.00 | 120,000.00 | 2,985,000.00 | - | **6,655,000.00** | **5.78** |
| **30** | බලපත්‍ර ගාස්තු | 221,000.00 | 815,000.00 | - | - | - | - | **1,036,000.00** | **0.90** |
| **40** | සේවා | 75,000.00 | 801,000.00 | 553,500.00 | 9,000,000.00 | 25,000.00 | 6,000.00 | **10,460,500.00** | **9.08** |
| **50** | වරෙන්තු ගාස්තු | 3,022,500.00 | | 1,000.00 | 155,000.00 | 1,000.00 | 7,500.00 | **3,187,000.00** | **2.77** |
| **60** | වෙනත් ආදායම් | 35,376,634.58 | 151,000.00 | 550,000.00 | 5,000.00 | - | 45,000.00 | **36,127,634.58** | **31.35** |
| **70** | ආදායම් ආධාර | 27,227,578.00 | 7,314,360.00 | 13,744,440.00 | 3,268,380.00 | 1,368,840.00 | 3,134,260.00 | **56,057,858.00** | **48.65** |
| | එකතුව | **66,910,181.42** | **9,761,360.00** | **18,398,940.00** | **12,548,380.00** | **4,380,840.00** | **3,222,760.00** | **115,222,461.42** | 100.00 |
| | ප්‍රතිශතය | 58.07 | 8.47 | 15.97 | 10.89 | 3.80 | 2.80 | **100.00** | |

## ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව
## 2024 වර්ෂයේ පුනරාවර්තන වැය සාරාංශය

| ගිණුම් සංකේතය | අය විෂය විස්තරය | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් මංමාවත් හා ගොඩනැගිලි | ජල සේවා | මහජන උපයෝගීතා සේවා | සුභසාධක සේවා | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | වැටුප් හා දීමනා | 27,987,294.00 | 12,507,497.00 | 16,871,112.00 | 3,578,380.00 | 1,958,680.00 | 4,638,940.00 | **67,541,903.00** | **63.04** |
| 2 | ගමන් වියදම් | 801,000.00 | 350,000.00 | 150,000.00 | 10,000.00 | 10,000.00 | 30,000.00 | **1,351,000.00** | **1.26** |
| 3 | සැපයුම් හා උපකරණ | 5,594,000.00 | 3,965,000.00 | 4,520,000.00 | 135,000.00 | - | 660,000.00 | **14,874,000.00** | **13.88** |
| 4 | ප්‍රාග්ධන වත්කම්අලුත්වැඩියාව හා නඩත්තුව | 1,750,000.00 | 1,430,000.00 | 3,825,000.00 | 2,500,000.00 | 600,000.00 | 50,000.00 | **10,155,000.00** | **9.48** |
| 5 | ප්‍රවාහන සම්බන්ධතා හා අවශ්‍යක සේවා | 2,606,000.00 | 1,000,000.00 | 250,000.00 | 3,850,000.00 | 300,000.00 | 130,000.00 | **8,136,000.00** | **7.59** |
| 6 | පොලිය හා ලාභාංශ | - | - | 70,800.00 | | - | - | **70,800.00** | **0.07** |
| 7 | ආධාර මුදල් දායක මුදල් හා සහනාධාර | 571,000.00 | 71,000.00 | 51,000.00 | - | 404,000.00 | 650,000.00 | **1,747,000.00** | **1.63** |
| 8 | විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික | 1,181,222.00 | 836,061.80 | 882,207.84 | 124,766.40 | 51,331.20 | 191,606.40 | **3,267,195.64** | **3.05** |
| 9 | එකතුව | **40,490,516.00** | **20,159,558.80** | **26,620,119.84** | **10,198,146.40** | **3,324,011.20** | **6,350,546.40** | **107,142,898.64** | **100.00** |
| | ප්‍රතිශතය | **37.79** | **18.82** | **24.85** | **9.52** | **3.10** | **5.93** | **100.00** | |

## ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව

## 2024 වර්ෂයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන ලැබීම් හා පුරාවර්තන හා ප්‍රාග්ධන වැය සාරාංශය

| අය විෂය විස්තරය | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැළසුම් මංමාවත් හා ගොඩනැගිලි | ජල සේවා | මහජන උපයෝගීතා සේවා | සුභසාධක සේවා | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| පුනරාවර්තන ආදායම | 66,910,181.42 | 9,761,360.00 | 18,398,940.00 | 12,548,380.00 | 4,380,840.00 | 3,222,760.00 | **115,222,461.42** |
| ප්‍රාග්ධන ආදායම | - | 1,000,000.00 | 2,700,000.00 | 1,000,000.00 | 1,000,000.00 | 1,500,000.00 | **7,200,000.00** |
| එකතුව | **66,910,181.42** | **10,761,360.00** | **21,098,940.00** | **13,548,380.00** | **5,380,840.00** | **4,722,760.00** | **122,422,461.42** |
| පුනරාවර්තන වියදම | 40,490,516.00 | 20,159,558.80 | 26,620,119.84 | 10,198,146.40 | 3,324,011.20 | 6,350,546.40 | **107,142,898.64** |
| ප්‍රාග්ධන වියදම | 500,000.00 | 1,050,000.00 | 7,452,000.00 | 2,876,000.00 | 1,000,000.00 | 2,400,000.00 | **15,278,000.00** |
| එකතුව | **40,990,516.00** | **21,209,558.80** | **34,072,119.84** | **13,074,146.40** | **4,324,011.20** | **8,750,546.40** | **122,420,898.64** |
| අතිරික්තය/හිගය | **25,919,665.42** | **(10,448,198.80)** | **(12,973,179.84)** | **474,233.60** | **1,056,828.80** | **(4,027,786.40)** | **1,562.78** |

# 2024 වර්ෂයේ අය සාරංශය

## වැඩ සටහන් අංක 01 - පොදු පරිපාලනය

පොදු පරිපාලනය යටතේ ප්‍රධාන ආදායම් ප්‍රභවයන් වන්නේ වරිපනම් බදු හා අක්කර බදු වේ.

- **වරිපනම් බදු (අය ශීර්ෂය 1/11)**

ඉඹුල්පේ ප්‍රාදේශිය සභාව සතුව ගලගම හා පින්නවල වරිපනම් කලාප 2 ක් වේ. 2023 වර්ෂයේ වරිපනම් බදු නැවත තක්සේරු කිරීම මේ වන විට සිදු කර ඇති අතර 2024 වර්ෂයේදී එම තක්සේරුව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. නව වරිපනම් තක්සේරුවෙන් වරිපනම් ඒකක 641 හඳුනාගැනීමට හැකි විය.ඒ අනුව 2024 වර්ෂය සඳහා ඇස්තමේන්තු වරිපනම් බදු ආදායම රු. 455,968.84 දක්වා 77% කින් වැඩි වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

- **අක්කර බදු (අය ශීර්ෂය 1/12)**

ඉඹුල්පේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ අක්කර බදු ඒකක 168කි. හෙක්ටයාර 1 කට වැඩි ඉඩම් සඳහා අක්කර බදු අය කරනු ලබයි. හෙක්ටයාර 1සිට 5 දක්වා ඉඩම් සඳහා රු.50 ක මුදලක්ද හෙක්ටයාර 5 ට වැඩි ඉඩම් සඳහා හෙක්ටයාරයට රු.10 බැගින්ද වශයෙන් රු.23,000.00 මුදලක් 2024 වර්ෂය වෙනුවෙන් ඇස්තමේන්තු කර ඇත.

- **ඉඩම් කට්ටි කිරීම මත බදු (අය ශීර්ෂය 1/18)**

බල ප්‍රදේශයේ ඉඩම් කට්ටි කර විකිනීමේදී අයකරන බදු ලෙස රු.500,000.00 ක් 2024 වර්ෂය සඳහා ඇස්තමේන්තු කර ඇත.මෙම ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව 75% පමණ අඩුවීමක් පෙන්නුම් කරයි.ආසන්න වර්ෂ කිහිපය තුලදීම මෙම ශීර්ෂය යටයේ ආදායම් උත්පාදනයක් නොවුබැවින් මෙම අය ශීර්ෂය යටතේ අපේක්ෂිත ආදායම අඩු කිරීමට සිදුවිය.

මීට අමතරව උසාවි දඩ, මුද්දර ගාස්තු ලැබීම් සහ ආදායම් ආධාර වැනි මූල්‍ය උත්පාදන මාර්ග තුලින් රු. 65,626,712.58

මුදලක් අපේක්ෂා කෙරේ.

- **දැන්වීම් පුවරු ගාස්තු (අය ශීර්ෂය 1/37)**

ප්‍රදේශය තුල ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් පුවරු වෙනුවෙන් එම පුවරු වල ප්‍රමණය අනුව ගාස්තු අය කරනු ලැබේ. පසුගිය වර්ෂ වලට සාපේක්ෂව බැලීමේදී මෙම ගාස්තු අය කිරීම වාර්ෂිකව වැඩිවී ඇති බව පැහැදිලිවේ. ඒ අනුව 2024 වර්ෂය සඳහා දැන්වීම් පුවරු ගාස්තු රු.220,000.00 ක් උපයා ගැනීමට අපේක්ෂා කරනු ලැබේ.



**ආදායම් ඇස්තමේන්තුව - 2024**
**වැඩසටහන් අංක 01 - පොදුපරිපාලනය**

| ශීර්ෂය | ආදායම් වර්ගය | 2021 සත්‍ය ආදායම | 2022 සත්‍ය ආදායම | 2023.06.30 දිනට සත්‍ය ආදායම | 2024 ඇස්තමේන්තුව |
|---|---|---|---|---|---|
| | **10 වරිපනම් හා බදු** | | | | |
| 1.11 | වරිපනම් | 223,321.19 | 244,351.68 | 222,914.81 | 455,968.84 |
| 1.11 (1) | වරිපනම් ලේඛනයේ නම වෙනස්කිරීම සඳහා ගාස්තු | | | | 7,500.00 |
| 1.11 (2) | වරිපනම් ලේඛනයේ උද්‍ධෘතයක් ලබාදීම සඳහා | | | | 1,000.00 |
| 1.12 | අක්කර බදු | 15,043.00 | 22,570.00 | 20,851.25 | 23,000.00 |
| 1.18 | ඉඩම් කට්ටි කිරීම මත බදු | - | | - | 500,000.00 |
| | එකතුව | **238,364.19** | **266,921.68** | **243,766.06** | **987,468.84** |
| | **30 බලපත්‍ර ගාස්තු** | | | | |
| 1.35 | වාහන හා සත්ව බදු(අලි ඇතුන් බයිසිකල්) | - | | - | 1,000.00 |
| 1.37 | වෙනත්(දැන්වීම් පුවරු ගාස්තු) | 8,600.00 | 50,409.75 | 80,856.25 | 220,000.00 |
| | එකතුව | **8,600.00** | **50,409.75** | **80,856.25** | **221,000.00** |
| | **40 සේවා සඳහා ගාස්තු** | | | | |
| 1.41 | ලි.ප. කිරීමේ සහතික හා පරීක්ෂණ ගාස්තු (සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම) | 82,810.00 | 72,000.00 | 3,750.00 | 75,000.00 |
| | එකතුව | **82,810.00** | **72,000.00** | **3,750.00** | **75,000.00** |
| | **50 වරෙන්තු ගාස්තු** | | | | |
| 1.51 | වරෙන්තු ගාස්තු | - | | - | 1,000.00 |
| 1.52 | දඩ (උසාවියෙන් ලැබෙන මුදල්) | - | 2,205,375.00 | | 3,021,500.00 |
| | එකතුව | **-** | **2,205,375.00** | **-** | **3,022,500.00** |
| | **60 වෙනත් ආදායම්** | | | | |
| 1.61(1) | පොලී(ආයෝජන පොලී) | 157,784.65 | 240,020.92 | 72,792.13 | 361,732.58 |
| 1.61(2) | පොලී( දේපල ණය පොලී) | 83,431.31 | 64,836.41 | 31,434.18 | 70,800.00 |
| 1.62(1) | විකුණුම්(මුද්‍රිත පෝර්ම, අබලි ද්‍රව්‍ය) | 55,115.00 | 160,592.41 | 213,145.00 | 100,000.00 |
| 1.62(2) | වෙනත් ලැබීම් ( ප්‍රදාන) | - | 3,029,167.20 | 2,161,237.23 | 2,100,000.00 |
| 1.64 | ක්‍රියාත්මක ආදායම්(සේවක ණය පොලී) | 282,120.59 | 273,923.90 | 163,515.60 | 327,000.00 |
| 1.65 | මුද්දර ගාස්තු ලැබීම් | 12,291,070.00 | 14,522,353.00 | 9,657,682.00 | 32,417,102.00 |
| | එකතුව | **12,869,521.55** | **18,290,893.84** | **12,299,806.14** | **35,376,634.58** |
| | **70 ආදායම් ආධාර** | | | | |
| 1.71(1) | සේවක වැටුප් ප්‍රතිපූර්ණ | 14,049,330.32 | 17,400,680.48 | 8,594,409.65 | 22,447,578.00 |
| 1.71(2) | මන්ත්‍රී දීමනා ප්‍රතිපූර්ණ | 4,694,850.00 | 4,695,000.00 | 1,397,700.00 | 4,680,000.00 |
| 1.71(3) | උපාධි පුහුණු ප්‍රතිපූර්ණ | 179,333.34 | - | - | 100,000.00 |
| | එකතුව | **18,923,513.66** | **22,095,680.48** | **9,992,109.65** | **27,227,578.00** |
| | මුළු එකතුව | **32,122,809.40** | **42,981,280.75** | **22,620,288.10** | **66,910,181.42** |

## වැඩ සටහන් අංක 02 - සෞඛ්‍ය සේවා

ප්‍රදේශය තුළ විධිමත් හා සෞඛ්‍ය ආරක්ෂිත පරිසරයක් ඇතිකිරීම හා පවත්වා ගෙන යාම සඳහා විධිමත් ලෙස කසළ කළමණාකරණය කිරීම, හෝටල් හා වෙළඳ සැල් නියාමනය කිරීම වැනි කාර්යන් තුලින් උත්පාදනය වන ආදායම් මෙන්ම කාබනික පොහොර අලෙවියෙන් උපයන ආදායම්ද සෞඛ්‍ය සේවා යටතේ වර්ග කර ඇත.

- කසළ ගාස්තු (අය ශීර්ෂය 2/42)

ප්‍රදේශයේ වරිපනම් කලාප වලට අයත් නොවන නිවාස සහ ව්‍යාපාරික ආයතන තුලින් බැහැර කරන කසල රැස්කිරීම වෙනුවෙන් අයකරන ගාස්තු මෙයට ඇතුලත්වේ. අපේක්ෂිත ආදායම රු. 700,000.00 කි.දැනට කසළ ලබාදෙන ස්ථාන 150 ක් පමණ වේ.මේ යටතේ නිවසකින් මසකට රු.200.00 ක්ද, වෙළෙඳ ව්‍යාපාර සඳහා මසකට 500.00 ක්ද නවාතැන් සහිත හෝටල් හා කර්මාන්ත සඳහා මසකට රු.4,500.00 බැගින්ද අය කෙරේ.දැනට කසළ රැස් කරන බදුල්ල හා පින්නවල ප්‍රධාන මාර්ග දෙකට අමතරව අතුරු මාර්ග දක්වාද අපගේ සේවාව ව්‍යාප්ත කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමට 2024 වර්ෂයේදී අපේක්ෂා කෙරේ.

- වෙළඳ බලපත්‍ර ගාස්තු (අය ශීර්ෂය 2/31)

සම්මත අතුරු ව්‍යවස්ථාව හා වෙනත් අතුරු ව්‍යවස්ථා අනුව බලපත්‍ර නිකුත් කිරීම තුලින් උත්පාදනය වන ආදායම් මීට ඇතුලත්වේ.අපේක්ෂිත ආදායම රු.315,000.00 කි.

- ව්‍යාපාර බදු (අය ශීර්ෂය 2/13)

බල ප්‍රදේශයේ වරිපනම් පවත්වාගෙන යන බලපත්‍ර ලබාගැනීමට අවශ්‍ය නොවන ව්‍යාපාර වලින් අය කරණු ලබන බදු මුදල් මෙයට ඇතුලත්වේ. අපේක්ෂිත ආදායම රු.680,000.00.

- විශේෂ ගාස්තු (අය ශීර්ෂය 2/36)

සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝටල් වලින් අය වෙතැයි පුරෝකථනය කර ඇති රු 200,000.00 මුදල අය ශීර්ෂයට ඇතුලත් වේ.මෙයට අමතරව වෙනත් ආදායම්, ආදායම් ආධාර හා ප්‍රාග්ධන ලැබීම් තුලින් රු 6,991,760.00 ක්ද ඇස්තමේන්තුකර ඇත.




ආදායම් ලැබීම් -වගුව - 02 (ප්‍රස්ථාර 2)

**ආදායම් ඇස්තමේන්තුව - 2024**

**වැඩසටහන් අංක 02 - සෞඛ්‍ය සේවා**

| ශීර්ෂය | ආදායම් වර්ගය | 2021 සත්‍ය ආදායම | 2022 සත්‍ය ආදායම | 2023.06.30 දිනට සත්‍ය ආදායම | 2024 ඇස්තමේන්තුව |
|---|---|---|---|---|---|
| | **10 වරිපනම් හා බදු** | | | | |
| 2.13 | ව්‍යාපාර බදු | 573,600.00 | 596,780.00 | 423,750.00 | 680,000.00 |
| | එකතුව | **573,600.00** | **596,780.00** | **423,750.00** | **680,000.00** |
| | **30 බලපත්‍ර ගාස්තු** | | | | |
| 2.31 | වෙළෙඳ බලපත්‍ර | 216,600.00 | 258,970.00 | 203,000.00 | 315,000.00 |
| 2.36 | විශේෂ ගාස්තු (සංචාරක හෝටල් ගාස්තු) | 221,625.30 | 278,646.06 | 189,619.97 | 500,000.00 |
| | එකතුව | **438,225.30** | **537,616.06** | **392,619.97** | **815,000.00** |
| | **40 සේවා සඳහා ගාස්තු** | | | | |
| 2.41 | ලි.ප. සහතික හා පරීක්ෂණ ගාස්තු (පාරිසරික බලපත්‍ර පරීක්ෂණ ගාස්තු) | - | | 60,510.00 | 100,000.00 |
| 2.42 | කසළ ගාස්තු | 684,400.00 | 827,000.00 | 465,600.00 | 700,000.00 |
| 2.43 | අයකර ගත හැකි ගාස්තු (සුසාන භූමි ගාස්තු හා සුනඛයන් ලියාපදිංචි කිරීම) | - | 12,000.00 | 5,000.00 | 1,000.00 |
| | එකතුව | **684,400.00** | **839,000.00** | **531,110.00** | **801,000.00** |
| | **60 වෙනත් ආදායම්** | | | | |
| 2.62 | විකුණුම්( වෛද්‍ය සහතික) | 930.00 | 200.00 | | 1,000.00 |
| 2.64 | ඝණ අපද්‍රව්‍ය කළමණාකරණය(නොදිරන කසළ) | 48,815.00 | | - | 100,000.00 |
| 2.65 | කාබනික පොහොර අලෙවිය. | - | 660,605.00 | 25,840.00 | 50,000.00 |
| | එකතුව | **49,745.00** | **660,805.00** | **25,840.00** | **151,000.00** |
| | **70 ආදායම් ආධාර** | | | | |
| 2.71 | සේවක වැටුප් ප්‍රතිපූර්ණ | 4,299,003.71 | 4,793,522.43 | 1,892,065.00 | 7,314,360.00 |
| 2.72 | සේවා සඳහා ගාස්තු (ආයුර්වේද ආධාර) | - | | - | |
| | එකතුව | **4,299,003.71** | **4,793,522.43** | **1,892,065.00** | **7,314,360.00** |
| | **80 ප්‍රාග්ධන ලැබීම්** | | | | |
| 2.8 | ඝණ අපද්‍රව්‍ය කළමණාකරණය(වැඩිදියුණු කිරීම) | - | - | - | 1,000,000.00 |
| | එකතුව | - | - | - | **1,000,000.00** |
| | මුළු එකතුව | **6,044,974.01** | **7,427,723.49** | **3,265,384.97** | **10,761,360.00** |

# වැඩ සටහන් අංක 03 - භෞතික සැලසුම් මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි

භෞතික සැළසුම් මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි ආදායම් ශීර්ෂය යටතේ ප්‍රධාන ආදායම් ප්‍රභවයන් තුනක් හදුනාගෙන ඇත.

- **යන්ත්‍ර කුළියට දීම (අය ශීර්ෂය 3/24)**

මෙම අය ශීර්ෂය යටතේ ප්‍රධාන වශයෙන්ම සභාව සතු බැකෝ ලෝඩර් යන්ත්‍රය කුළියට දීම මගින් ලැබෙන ආදායම ඇතුළත් කර ඇති අතර ඊට අමතරව ලෙලන තලනය කුළියට දීම හා සම්පීඩන යන්ත්‍රය කුළියට දීම මගින් ලැබෙන ආදායම ද ඇතුළත්ව ඇත.යන්ත්‍ර කුළියට දීමේ ගාස්තු සංශෝදනය කර ඇති බැවින් පසුගිය වසරට සාපේක්ෂව වැඩි ආදයමක් අපේක්ෂා කරන අතර අපේක්ෂිත ආදායම රු. 2,550,000.00 කි.

- **සේවා සදහා ගාස්තු (අය ශීර්ෂය 3/43 -3 /44)**

මේ යටතේ ප්‍රධාන වශයෙන් නොපවරා ගැනීමේ සහතික සහ ගොඩනැගිලි සීමා සහතික නිකුත් කිරීම, හියුම් බට අලෙවිය ,ගොඩනැගිලි සැළසුම් හා අනුකුලතා සහතික ලබා දීම හා බිම් කට්ටි සැළසුම් අනුමත කිරීම මගින් ඇස්තමේන්තු ගත ආදායම රු.553,500.00කි.

මෙයට අමතරව වරෙන්තු ගාස්තු සහ දඩ, ආදායම් ආධාර හා දායක මුදල් හා කර්මාන්ත ලැබීම් හා සූර්ය බල ශක්ති පද්ධතිය සවිකිරීම සඳහා ණය ගැනීම හා වෙනත් ආදායම් මගින් රු. 14,115,440.00 ක් 2024 වර්ෂය සඳහා ඇස්තමේන්තු කර ඇත.මේ යටතේ පින්නවල කුඩා නගරය ඉදිකිරීම සඳහා ඉඩම් අත්පත්කර ගැනීම කෙරෙහි අවධානය යොමුකර ඇත.




ආදායම් ලැබීම් -වගුව 3 (ප්‍රස්ථාර 3)

ආදායම් ඇස්තමේන්තුව - 2024

වැඩසටහන් අංක 03 - භෞතික සැළසුම් මං මාවත් ඉඩම් හා ගොඩනැගිලි

| ශීර්ෂය | ආදායම් වර්ගය | 2021 සත්‍ය ආදායම | 2022 සත්‍ය ආදායම | 2023.06.30 දිනට සත්‍ය ආදායම | 2024 ඇස්තමේන්තුව |
|---|---|---|---|---|---|
| | 20 කුලී | | | | |
| 3.24 | කුළියට දීම (යන්ත්‍ර කුලියට දීම) | 995,350.00 | 881,625.00 | 1,761,530.00 | 3,550,000.00 |
| | එකතුව | **995,350.00** | **881,625.00** | **1,761,530.00** | **3,550,000.00** |
| | 40 සේවා සඳහා ගාස්තු | | | | |
| 3.43(1) | නොපවරා ගැනීමේ හා ගොඩනැගිලි සීමා සහතික නිකුත් කිරීම | 182,500.00 | 120,000.00 | 43,750.00 | 200,000.00 |
| 3.43(2) | කොන්ත්‍රාත් කරුවන් ලියාපදිංචි කිරිම | - | 1,250.00 | | 2,500.00 |
| 3.44(1) | ගොඩනැගිලි සැළසුම් හා අනුකූලතා සහතික ගාස්තු/විදුලි සංදේශ කුළුණු ඉදිකිරීම | 144,250.00 | 374,363.00 | 200,270.00 | 300,000.00 |
| 3.44(2) | ඉඩම් කට්ටි සැලසුම් අනුමත කිරීම | 36,500.00 | 29,750.00 | 13,000.00 | 50,000.00 |
| 3.44(3) | හියුමබට අලෙවිය | 23,750.00 | 37,600.00 | - | 1,000.00 |
| | එකතුව | **387,000.00** | **562,963.00** | **257,020.00** | **553,500.00** |
| | 50 වරෙන්තු ගාස්තු හා දඩ | | | | |
| 3.51 | වරෙන්තු ගාස්තු (කර්මාන්ත ප්‍රමාද දඩ) | - | | - | 1,000.00 |
| | එකතුව | - | - | - | **1,000.00** |
| | 60 වෙනත් ආදායම් | | | | |
| 3.62 | පෝර්ම ගාස්තු හා වෙනත් ලැබීම් (අනතුරුදායක ගස් හා ගොඩනැගිලි | 52,720.00 | 46,545.00 | 12,170.00 | 100,000.00 |
| 3.63 | සූර්ය බල ශක්ති ලැබීම්(ගලගම බහුකාර්ය ගොඩනැගිල්ල) | - | | 378,105.61 | 450,000.00 |
| | එකතුව | **52,720.00** | **46,545.00** | **390,275.61** | **550,000.00** |
| | 70 ආදායම් ආධාර | | | | |
| 3.71 | සේවක වැටුප් ප්‍රතිපූර්ණ | 7,417,493.26 | 9,255,680.00 | 4,756,777.50 | 13,744,440.00 |
| | එකතුව | **7,417,493.26** | **9,255,680.00** | **4,756,777.50** | **13,744,440.00** |
| | 80 ප්‍රාග්ධන ලැබීම් | | | | |
| 3.81 | කර්මාන්ත ලැබීම් | 0.00 | 43,443.54 | 24,775.06 | 200,000.00 |
| 3.82 | පින්නවල කුඩානගරය ඉදිකිරීම සඳහා ඉඩම අත්පත් කරගැනීමට ප්‍රතිපාදන ලබාගැනීම. | - | | - | 2,500,000.00 |
| | එකතුව | - | **43,443.54** | **24,775.06** | **2,700,000.00** |
| | මුළු එකතුව | **8,852,563.26** | **10,790,256.54** | **7,190,378.17** | **21,098,940.00** |

## වැඩ සටහන් අංක 04 - ජල සේවා

ප්‍රදේශයේ ජනතාවගේ පානීය ජල අවශ්‍යතා හා වෙනත් අවශ්‍යතා ඉටුකිරීම වෙනුවෙන් අවශ්‍ය වන ජල සම්පාදන කාර්යන් මගින් උත්පාදනය වන ආදායම මෙයට ඇතුලත් වේ.ජල ව්‍යාපෘති දහයක් (9) ක්‍රියාත්මක වේ.

- ජල ගාස්තු (අය ශීර්ෂ 4/14)
    - අලුත්නුවර සිඩ්නි එල්ලාවල ජල ව්‍යාපෘතිය
    - නළුවෙල ජල ව්‍යාපෘතිය
    - වැටකොළුලන්ද ජල ව්‍යාපෘතිය
    - පින්නවල ජල ව්‍යාපෘතිය
    - රත්මලවින්න ජල ව්‍යාපෘතිය
    - පඹහින්න ජල ව්‍යාපෘතිය
    - අමුවතුගොඩ ජල ව්‍යාපෘතිය
    - ගලගම ජල ව්‍යාපෘතිය
    - නාකැටියවත්ත ජල ව්‍යාපෘතිය
    -

2024 වර්ෂයේ දී ජල ගාස්තු සංශෝධනය කිරීමට තීරණය කර ඇති අතර ඒ අනුව ඉහත ජල යෝජනා ක්‍රම මගින් සපයන ජලය සඳහා අය කරන ගාස්තු වෙනුවෙන් 2024 වර්ෂය සඳහා ඇස්තමේන්තුකර ඇති අදායම රු 8,500,000.00 කි.

- ජල බවුසරය කුළියට දීම (අය ශීර්ෂ 4/25)

සභාව සතු ජල බවුසරය කුළියට දීම මගින් උපයා ගැනීමට අපේක්ෂිත ආදායම රු. 100,000.00 වේ.

- සේවා සඳහා ගාස්තු (අය ශීර්ෂ 4/43)

නව ජල සම්බන්ධතා ලබා දීම වෙනුවෙන් අය කරන ගාස්තු මීට ඇතුලත් වේ. නව ජල සැපයීමක් වෙනුවෙන් අයකරන ගාස්තුව රු.13,000.00 වේ. නව ජල සම්බන්ධතා ලබාදීම් වැඩි කිරීම මගින් 2024 වර්ෂයේදී මේ මගින් අපේක්ෂිත ආදායම රු.500,000.00 වේ.

මීට අමතරව ජල සේවා අයඳුම්පත් ගාස්තු ,වරෙන්තු ගාස්තු හා දඩ ආදායම් ආධාර හා දායක මුදල් සහ 2024 වර්ෂයේදී ජල ව්‍යාපෘති නවීකරණය සඳහා අපේක්ෂිත ණය ගැනීම් ඇතුලත්ව අපේක්ෂිත ආදායම රු. 3,468,380.00 කි.




ආදායම් ලැබීම් වගුව 4 ( ප්‍රස්ථාර 4)

ආදායම් ඇස්තමේන්තුව - 2024

වැඩසටහන් අංක 04 - ජල සේවා

| ශීර්ෂය | ආදායම් වර්ගය | 2021 සත්‍ය ආදායම | 2022 සත්‍ය ආදායම | 2023.06.30 දිනට සත්‍ය ආදායම | 2024 ඇස්තමේන්තුව |
|---|---|---|---|---|---|
| | 10 වරිපනම් හා බදු | | | | |
| | 20 කුළී | | | | |
| 4.25 | ජල බවුසරය කුළියට දීම | 70,000.00 | 78,885.00 | 15,000.00 | 100,000.00 |
| 4.25 (1) | ජල බවුසරය රදවා තබා ගැනීමේ ගාස්තු | | | | 15,000.00 |
| 4.25 (2) | ජල බවුසරය කි.මී.10 ඉක්මවන අවස්ථාවලදී අමතර කි.මී. ගණනට අය | | | | 5,000.00 |
| | එකතුව | **70,000.00** | **78,885.00** | **15,000.00** | **120,000.00** |
| | 40 සේවා සඳහා ගාස්තු | | | | |
| 4.41 | පානීය ජලය ලබාදීමේ ගාස්තු | 6,142,701.00 | 6,536,899.50 | 3,966,068.00 | 8,500,000.00 |
| 4.43 | අයකරගතහැකි ගාස්තු (නව ජල සේවා සැපයුම් ගාස්තු) | 397,500.00 | 445,000.00 | 232,500.00 | 500,000.00 |
| | එකතුව | **6,540,201.00** | **6,981,899.50** | **4,198,568.00** | **9,000,000.00** |
| | 50 වරෙන්තු ගාස්තු හා දඩ | | | | |
| 4.51 | වරෙන්තු (විසන්ධි කළ ජල සේවා නැවත ලබා දීමේ ගාස්තු) | 10,500.00 | 10,500.00 | 15,000.00 | 150,000.00 |
| 4.52 | අනවසර ලබා ගැනීමේ දඩ | 1,650.00 | - | - | 5,000.00 |
| | එකතුව | **12,150.00** | **10,500.00** | **15,000.00** | **155,000.00** |
| | 60 වෙනත් ආදායම් | | | | |
| 4.62 | විකුණුම්(ජල සේවා අයදුම් පත් හා වෙනත්) | 1,500.00 | 1,600.00 | 525.00 | 5,000.00 |
| | එකතුව | **1,500.00** | **1,600.00** | **525.00** | **5,000.00** |
| | 70 ආදායම් ආධාර හා දායක මුදල් | | | | |
| 4.71 | සේවක වැටුප් ප්‍රතිපූර්ණ | 1,575,228.38 | 1,656,262.39 | 794,045.97 | 3,268,380.00 |
| | එකතුව | **1,575,228.38** | **1,656,262.39** | **794,045.97** | **3,268,380.00** |
| | 80 ප්‍රාග්ධන ලැබීම් | | | | |
| 4.81 | ජල ව්‍යාපෘති නවීකරණය සඳහා ණය ලබා ගැනීම (පින්නවල,ගලගම,අලුත් නුවර,) | | - | - | 1,000,000.00 |
| | එකතුව | - | - | - | **1,000,000.00** |
| | මුළු එකතුව | **8,199,079.38** | **8,729,146.89** | **5,023,138.97** | **13,548,380.00** |

## වැඩ සටහන් අංක 05 - උපයෝගිතා සේවා

මෙම වැඩ සටහන යටතේ කඩකාමර කුලී, පොළ බදු, සේවා ගාස්තු හා වරෙන්තු ගාස්තු යන අය ශීර්ෂ කෙරෙහි ප්‍රධාන වශයෙන් අවධානය යොමු කර ඇත.

- වෙළඳ ස්ථාන කුලියට දීම (අය ශීර්ෂ 5/22)

ඉඹුල්පේ ප්‍රාදේශිය සභාව සතු පින්නවල පොල භූමියේ පිහිටි කඩ කාමර 05 කුලියට දීම මගින් අය කරගත හැකි ආදායම මෙයට ඇතුලත්වේ. 2024 වර්ෂයේ සිට මාසික කුළිය පමණක් අයකර ගැනීමට ඇත.ඒ අනුව 2024 වර්ෂයට අදාලව අපේක්ෂිත ආදායම රු.45,000.00වේ.

- පොළ බදු (අය ශීර්ෂ 5/23)

පින්නවල හා පඹහින්න ප්‍රදේශ තුළ මහජන පොළ දෙකක් පැවති අතර ඉන් පින්නවල පොළ මේ වන විට ක්‍රියාකාරී තත්වයේ නොපවතී. එම භූමියේ පොළ නැවත පැවැත්වීමට 2024 අපේක්ෂා කරන අතර පසුගිය වර්ෂ කිහිපය තුළම එය ක්‍රියාකාරී තත්වයට ගෙන ඒමට අපහසු විය. ඒ අනුව පඹහින්න ප්‍රදේශයේ පවත්වා ගෙන යන මහජන පොළ මගින් අපේක්ෂිත රු.60,000.00ක ආදායම පමණක් 2024 වර්ෂය සඳහා ඇස්තමේන්තු ගත ආදායම ලෙස සලකන ලදී.

- ගොඩනැගිලි බදු කුළී (අය ශීර්ෂ 5/24)

ගොඩනැගිලි බදු කුලී යටතේ ගලගම සංචාරක මධ්‍යස්ථානය, ගලගම බහු කාර්ය ගොඩනැගිල්ල හා දියපහස ගිමන්හල බදු දිම මගින් ආදායම් ඉපයිමට අපේක්ෂා කරන අතර 2024 වර්ෂය සඳහා රු. 2,080,000.00ක් ඇස්තමේන්තු ගත ආදායම වේ.

- වරෙන්තු ගාස්තු (අය ශීර්ෂ 5/51)

නියමිත පරිදි කඩ කාමර කුලි නොගෙවන කඩ කාමර තුලින් අය කිරීමට සිදුවන දඩ මුදල් මෙයට ඇතුලත් අතර අපේක්ෂිත ආදායම රු1,000.00 කි.මීට අමතරව වරෙන්තු ගාස්තු සහ ආදායම් ආධාර මගින් රු.2,009,840.00 මුදලක් අය වේ යැයි අපේක්ෂා කෙරේ.




ආදායම් ලැබීම් - වගුව 5 (ප්‍රස්ථාර 5)

ආදායම් ඇස්තමේන්තුව - 2024

වැඩසටහන් අංක 05 - මහජන උපයෝගිතා සේවා

| ශීර්ෂය | ආදායම් වර්ගය | 2021<br>සත්‍ය ආදායම | 2022<br>සත්‍ය ආදායම | 2023.06.30 දිනට<br>සත්‍ය ආදායම | 2024<br>ඇස්තමේන්තුව |
|---|---|---|---|---|---|
| | 10 වරිපනම් හා බදු | | | | |
| 5.13 | සභාව සතු ඉඩම් හා ශාලා රැස්වීම් සඳහා කුළියට දීම | | - | - | 1,000.00 |
| | එකතුව | - | - | - | **1,000.00** |
| | 20 කුළී | | | | |
| 5.22(1) | වෙළෙඳ අයිතිය බදු දීම (පින්නවල කඩකාමර) | 30,000.00 | 45,000.00 | 21,000.00 | 45,000.00 |
| 5.22(2) | පින්නවල කඩ කාමර වාර්ෂික කුලී | 230,000.00 | 245,000.00 | 230,000.00 | |
| 5.23 | වෙළෙඳ අයිතිය බදු දීම (පොළ බදු) | 36,930.00 | 54,170.00 | 29,860.00 | 60,000.00 |
| 5.24(1) | ගලගම සංචාරක මධ්‍යස්ථානය බදු දීම | | 137,850.00 | 80,000.00 | 480,000.00 |
| 5.24(2) | දියපහස ගිමන් හල බදු දීම | 132,950.00 | 292,490.00 | 186,130.00 | 400,000.00 |
| 5.24 (3) | ගලගම බහුකාර්ය ගොඩනැගිල්ල බදු දීම | | 600,000.00 | - | 1,200,000.00 |
